ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
**President of Sri Lanka**

**පණිවිඩය**

"අභියෝගාත්මක කාලයන්හි දී ඩිජිටල් පරිවර්තනය වේගවත් කිරීම" තේමාව යටතේ 2021 ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය සැමරීම සඳහා ශ්‍රී ලංකාව ලෝකයේ සෙසු රටවල් සමග අත්වැල් බැඳගන්නා අවස්ථාවේ මගේ සුබපැතුම් එක් කරනුයේ ඉමහත් සතුටිනි.

කොවිඩ් 19 වසංගත තත්ත්වය සමාජයේ සෑම අංශයකම තොරතුරු සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම පවතින හැකියාව තීව්‍ර කරලීමට හේතු විය. තවදුරටත්, බාධාකාරී නවෝත්පාදනයන් ඩිජිටල් ආර්ථිකයක් හා සමාජයක් කරා සංක්‍රමණය වීම වේගවත් කරලීමට අත්‍යාවශ්‍ය සාධකයක් බව ප්‍රත්‍යක්ෂ වී ඇත.

ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය 2021 සමරන මේ අවස්ථාවේ දී අන්තර් ජාතික විදුලි සංදේශ සංගමය, සමාජ ආර්ථික සහ පාරිසරික තිරසාරත්වය සහතික කරමින් ඩිජිටල් පරිවර්තනයට සහ ඩිජිටල් ලෝකයේ අසමානතාවන් අවම කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස සිය සාමාජික රටවලට ආරාධනා කරයි. ශ්‍රී ලංකාව තාක්ෂණික නවෝත්පාදන සඳහා පරිවර්තනය කිරීම මෙන්ම අප රට "ස්මාර්ට් ශ්‍රී ලංකාවක්" බවට පත් කරලීමේ දැක්මක් සහිතව රාජ්‍ය හා පෞද්ගලික අංශයට අවශ්‍ය ජාතික ඩිජිටල් පරිවර්තන ක්‍රියාවලියක් ආරම්භ කර තිබේ.

දශක ගණනාවක් තිස්සේ ලොව පුරා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම ප්‍රවර්ධනය සඳහා අන්තර් ජාතික විදුලි සංදේශ සංගමය බලපෑමක් ලබා දී ඇත. එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක සහ අන්තර් ජාතික විදුලි සංදේශ සංගමයේ "Connect 2030" න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමේදී සංගමය විසින් සිදු කරන ලද කාර්ය භාරය ප්‍රශංසනීයය. තවදුරටත්, "මෙතෙක් සම්බන්ධ නොවූ කොටස් සම්බන්ධිත කරලීම" සඳහා ඩිජිටල් පරිවර්තනය වේගවත් කරලීමට හා ගෝලීය මට්ටමින් තිරසර සංවර්ධනය ළඟා කරලීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම සහතික කරලීමට අන්තර් ජාතික විදුලි සංදේශ සංගමය තම සාමාජිකයන් ධෛර්යමත් කරයි.

අන්තර් ජාතික විදුලි සංදේශ සංගමය සිය 156 වන සංවත්සරය සමරන මේ අවස්ථාවේ, ලොව පුරා සිටින ජනතාවට ඵලදායී ලෙස ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනයක් සැමරීමට හැකිවේවා යි පතමි.

**ගෝඨාභය රාජපක්ෂ**

2021 මැයි මස 15 වන දින